මගේ අංකය :-රාදෑ,සං.4/අ/11/මිල ගණන්/2025
අලෙවි අංශය,
රාජ්‍ය දැව සංස්ථාව.
බත්තරමුල්ල
2025.08.05

**<u>වල්ලපට්ටා දැව පතුරු, දැව කැබැලි, කඳන්, කුඩු, දැව කොටස් මිලදී ගැනීම සඳහා මුද්‍රිත මිළ ගණන් කැඳවීම</u>**

රාජ්‍ය දැව සංස්ථාවේ කල්දෙමුල්ල නව ගබඩාවේ පහත සඳහන් ප්‍රමාණ වලින් යුක්ත වල්ලපට්ටා මිශ්‍ර දැව කොටස් අලෙවි කිරීම සඳහා මුද්‍රිත මිළ ගණන් කැඳවනු ලැබේ.

තොග පිළිබඳ විස්තර පහත දැක්වේ.

| තොග අංකය | අයිතමය | ප්‍රමාණය | බර කිලෝ ග්‍රෑම් |
|---|---|---|---|
| 01 | පතුරු | මලු 01 - 10 | 96.1 Kg |
| 02 | පතුරු | මලු 11 - 20 | 98.3 Kg |
| 03 | පතුරු | මලු 21 - 30 | 106.2 Kg |
| 04 | පතුරු | මලු 31 - 40 | 88 Kg |
| 05 | පතුරු | මලු 41 - 50 | 96.1 Kg |
| 06 | පතුරු | මලු 51 - 50 | 60.9 Kg |
| 07 | දැව කැබලි | -- | 20 Kg |
| 08 | කඳන් කැබලි | 82 $dm^3$ | 37.7Kg |
| 09 | කුඩු | -- | 470 g |

02. මිළ ගණන් ඉදිරිපත් කළ යුත්තේ ආපසු නොගෙවන රු:2000.00ක ගාස්තුවක් සහ රු:50,000.00 ක ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදලක් ගෙවා, ලබාගත් නියමිත ආකෘති පත් මගින් පමණි. මෙම ආකෘති පත් බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලයේ අලෙවි අංශයෙන්, හෝ කොළඹ ප්‍රාදේශිය කාර්යාලයෙන් පමණක් ලබාගත හැක. ආකෘති පත්‍රයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවේ නම් ඇමුණුමක් මගින්ද මිළ ගණන් ඉදිරිපත් කල හැක. එකී ඇමුණුම සමඟ, මුදල් ගෙවා ලබාගත් නියමිත ආකෘති පත්‍රය ද අමුණා තිබිය යුතුය.

03. දැව තොග 2025.08.29 දින පෙ.ව. 09.00 සිට 12.00 පැය දක්වාද, එදින 12.10 පැයට බහාලුම් වල අසුරා ඇති තොග ඔබ ඉදිරියේ කමිටුවක් මගින් මුද්‍රා තබනු ඇත.

04. මිල ගණන් ඉදිරිපත් කිරීමෙන් පසු කරනු ලබන අභියාචනා සලකා බලනු නොලැබේ. එම නිසා දැව තොග පරික්ෂා කර බලා මිල ගණන් ඉදිරිපත් කිරීමට ඉල්ලුම්කරුවන් වගබලා ගත යුතුය.

05. මිල ගණන් ආකෘති පත්‍ර නිකුත් කිරීම 2025.08.06 දින සිට 2025.09.01 දින දක්වා සතියේ රාජකාරි දිනවල පෙ.ව.09.00 සිට ප.ව.03.00 දක්වා මිලදී ගත හැකිය. මිළ ගණන් ආකෘති පත්‍ර නිකුත් කිරීම 2025.09.01 වන දින 15.00 පැයට අවසන් කරනු ලබන අතර, මිළ ගණන් පත් භාර ගැනීම 2025.09.02 දින පෙ.ව.10.15 අවසන් කරනු ලැබේ. මිළ ගණන් පත් 2025.09.02 වන දින පෙ.ව.10.20 ට විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට මිළ ගණන් පත් ඉදිරිපත් කළ අයට හෝ බලය ලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

06. මිළ ගණන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්කරුවන් තම මිළ ගණන් නියමිත ආකෘති පත්‍රයෙහි සඳහන්කොට, ලියුම් කවරයක බහා, මුද්‍රා තබා එම ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ " <u>වල්ලපට්ටා දැව පතුරු, දැව කැබැලි, කඳන්, කුඩු, දැව කොටස් මිලදී ගැනීම්</u>" යනුවෙන් පැහැදිලිව ලියා, මේ වෙනුවෙන් රාජ්‍ය දැව සංස්ථා ප්‍රධාන කාර්යාලිය ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට 2025.09.02 දින 10.15 පැයට හෝ ඊට පෙර බහාලීමට හෝ "සභාපති, රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවීමට කටයුතු කල යුතුය. ප්‍රමාදවී ලැබෙන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

CamScanner

07. ඉදිරිපත් කරනු ලබන මිල කැඳවීම් පත්වල අදාල මිල ගණන් ඉලක්කමෙන් හා අකුරෙන් සඳහන් කල යුතු අතර, සියලුම කපා දැමීම් හා මැකීම් ආදිය තම කෙටි අත්සන යොදා සහතික කල යුතුය. එසේම මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ආකෘතියේ සෑම පිටපතකම, තම අත්සන තබා සනාථ කළ යුතුය. ඉලක්කමෙන් සහ අකුරෙන් සඳහන් කල මිල ගණන් එකිනෙකට පරස්පර වේනම්, අකුරෙන් සඳහන් කළ මිල ගණන් පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලයට බලය ඇත.

08. ජයග්‍රාහී මිල ගණන් ඉදිරිපත් කළ අයට, ඒ පිළිබඳව දැනුම් දීමෙන් පසු, රාජකාරි දින 07 තුළ තොග වටිනාකමෙන් 50%ක මුදල් තැන්පත් කර තහවුරු කල යුතුය. එම කාලය තුළ ජයග්‍රාහී ලංසුකරු විසින් තහවුරු නොකරන්නේ නම් ඊලග ජයග්‍රාහී ටෙන්ඩර්කරුට අලෙවි කිරීමට ක්‍රියා කරනු ඇත.

50% අත්තිකාරම් මුදල් ගෙවා වැඩකරන දින 30 (මසක්) තුළ ඉතිරි මුදල් ගෙවා, සියළුම තොග ඉවත්කලයුතු අතර, මසක් තුළ ඉවත් කර නොගන්නා තොග සඳහා තොගයේ වටිනාකමෙන් 05% ක දඩ මුදලක්ද අයකර අදාල තොග නිදහස් කිරීමට කටයුතු කරනු ඇත. ඇණවුම තහවුරු කර, වැඩ කරන දින 60ක් (මාස දෙකක්) තුළ තොග ඉවත්කර නොගන්නේ නම් 50% තැන්පත් මුදල සංස්ථා සතුකර අදාල තොගය ඊලග ජයග්‍රාහී ටෙන්ඩර්කරුට පිරිනමනු ලබයි.

ආපසු ගෙවනු ලබන තැන්පතුව තොග ප්‍රතිග්‍රහණයෙන් පසුව ඉල්ලුම්කරුගේ ඉල්ලීම පරිදි නිදහස් කරනු ඇත.

09. නියමිත උපදෙස් මාලාවට අනුකූල නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. මෙම ටෙන්ඩරයේ කොටසක් හෝ සම්පූර්ණයෙන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රසම්පාදන මණ්ඩලය සතුවන අතර, එම තීරණය අවසන් තීරණය වේ.

11. ම�ෙම ටෙන්ඩරයට අදාල පැහැදිලිකර ගැනීම් හා වැඩිපුර විමසීම සඳහා:-
සහකාර කළමනාකාර (අලෙවි)
රාජ්‍ය දැව සංස්ථාව,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

දු.ක.අංක:- 0768030100 - 0112866636
විද්‍යුත් තැපැල - dgmm@timco.lk.

සභාපති,
ප්‍රසම්පාදන මණ්ඩලය,
රාජ්‍ය දැව සංස්ථාව.

ඉහත සඳහන් උපදෙස් හා කොන්දේසි සඳහා එකග වෙමි.

ලංසුකරුගේ නම ................................................................................ජාතික හැඳුනුම්පත් අංකය.........................ලංසුකරුගේ අත්සන................................දිනය............................

ගිමා/0007400006

මුල් පිටපත / අනු පිටපත

(පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි)

රාජ්‍ය දැව සංස්ථාව,
පරිසර අමාත්‍යාංශය,

**<u>වල්ලපට්ටා පතුරු, දැව කැබැලි, කඳන්, කුඩු දැව කොටස් අලෙවි කිරීම සඳහා මුදිත මිළ ගණන් කැඳවීම</u>**

**<u>මුදිත මිළ ගණන් ආකෘති පත්‍රය</u>**

(කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා පමණි)

රාජ්‍ය දැව සංස්ථාවේ කල්දෙමුල්ල නව ගබඩාවේ පහත සඳහන් වල්ලපට්ටා දැව කොටස් මිළදී ගැනීම සඳහා ........................................................................................................................ ලිපිනයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක:................................ දරණ ........................................................ මයා/මිය විසින් ගෙවීම් කරන ලද ආපසු නොගෙවනු ලබන රු:2000/- ක මුදල සඳහා අංක:.............................. හා ........................................ දිනැති කුවිතාන්සිය ද, ආපසු ගෙවනු ලබන රු:50,000/-ක ඇප තැන්පත් මුදල සඳහා අංක:........................... හා ........................................... දිනැති කුවිතාන්සියද රාජ්‍ය දැව සංස්ථාවෙන් නිකුත් කරන ලදී.

දිනය:-.........................................

නිකුත් කරන නිලධාරියාගේ අත්සන.
නි.සාමාන්‍යාධිකාරි(අලෙවි)/ප්‍රා.කළමනාකාර/
සහකාර කළමනාකාර(පාලන)

නිල මුද්‍රාව

---

ඉල්ලුම්කරු විසින් සම්පූර්ණ කල යුතුය (ඇමුණුම අංක: 1)

වල්ලපට්ටා දැව කොටස් සඳහා මිළ ගණන් කල්දෙමුල්ල නව ගබඩාව

තොග ලැයිස්තුව:-

| තොග අංකය | අයිතමය | ප්‍රමාණය | බර කිලෝ ග්‍රෑම් | මුදල ඉලක්කමෙන් | මුදල අකුරෙන් |
|---|---|---|---|---|---|
| 01 | පතුරු | මලු 01 - 10 | 96.1 | | |
| 02 | පතුරු | මලු 11 - 20 | 98.3 | | |
| 03 | පතුරු | මලු 21 - 30 | 106.2 | | |
| 04 | පතුරු | මලු 31 - 40 | 88 | | |
| 05 | පතුරු | මලු 41 - 50 | 96.1 | | |
| 06 | පතුරු | මලු 51 - 57 | 60.9 | | |
| 07 | දැව කැබලි | -- | 20 | | |
| 08 | කඳන් කැබලි 4 | 82 $dm^3$ | 37.7 | | |
| 09 | කුඩු | -- | 470g | | |

(මෙම ආකෘති පත්‍රය ප්‍රමාණවත් නොවේ නම් ඇමුණුමක් මගින් ඉතිරි තොග සඳහා මිළ ගණන් ඉදිරිපත් කරන්න. සියලුම ඇමුණුම් වල නම සහ සම්පූර්ණ අත්සන් යොදා තිබිය යුතුය.)

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ජයග්‍රාහී ටෙන්ඩර්කරු විසින් අදාල මුදලින් 50%ක මුදලක් සතියක් ඇතුළත අදාල ගබඩාවේ තැන්පත් කලයුතු අතර, මාසයක් ඇතුළත සම්පූර්ණ මුදල ගෙවා දැව තොග ඉවත් කරගත යුතුය.

මෙම කඳන් තොග සඳහා එක් එක් තොගයට මිළ ගණන් ඉලක්කමින් හා අකුරින් සඳහන් කර, ටෙන්ඩර් පත් 2025.09.02. දින පෙ.ව.10.15ට පෙර මුද්‍රා තබා පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ ප්‍රධාන කාර්යාලයේ සභාපති අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කලයුතු අතර, (ටෙන්ඩර් පත් පිටපත් 02කින් යුක්තව) එදින පෙ.ව.10.20ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ඉල්ලුම්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගි විය හැක. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමේදී මිළ ගණන් සහිත කවරයේ වම්පස කෙළවරේ 'වල්ලපට්ටා දැව කොටස් **ටෙන්ඩර් මගින් අලෙවි කිරීම සඳහා මිළ ගණන් කැඳවීම-කල්දෙමුල්ල නව ගබඩාව"** යන්න සඳහන් කල යුතුය.

<u>ලිපිනය:-</u>
සභාපති,
රාජ්‍ය දැව සංස්ථාව,
අංක: 82, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

දුරකථන අංකය: 0112866636/0112866600

මෙම ටෙන්ඩරයේ කොටසක් හෝ සම්පූර්ණයෙන් පිලිගැනීම මෙන්ම, ප්‍රතික්ෂේප කිරීමේ බලය රාජ්‍ය දැව සංස්ථාවේ සභාපති සතුවන අතර, ටෙන්ඩර් සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසන් තීරණය වශයෙන් පිළිගැනීමට ටෙන්ඩර්කරු/කාරිය බැඳී සිටිනු ඇත.

දිනය:-.................................

අත්සන:..........................................

දුරකථන අංකය:................................................

නම:.................................................

හිමා/00640017

~~මුල් පිටපත~~ / ~~අනු පිටපත~~